**දිළිඳු හිතකාමී ආර්ථිකය උසස් කිරීමේ සහ ප්‍රජාව වැඩි දියුණු කිරීමේ (පීඊපීසීඊ) ව්‍යාපෘතිය - 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

දිළිඳු හිතකාමී ආර්ථිකය උසස් කිරීමේ සහ ප්‍රජාව වැඩි දියුණු කිරීමේ (පීඊපීසීඊ) ව්‍යාපෘතියේ 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වර්තමානයේ ජපන ජාත්‍යනතර සහයෝගිතා නියෝජිතායතනය (ජජාසනි) නමින් හැඳින්වෙන ජාත්‍යන්තර සහයෝගිතාවය පිළිබඳ ජපන් බැංකුව (ජාසජබැ) අතර 2003 මාර්තු 26 දින එළඹි අංක එස්එල්පී 77 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4.7 වගන්තිය සහ 2011 මැයි 20 දින ණය ගිවිසුමට කරන ලද සංශෝධනය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

දිළිඳු හිතකාමී ආර්ථිකය උසස් කිරීමේ සහ ප්‍රජාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (පීඊපීසීඊ) ණය ගිවිසුමට අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, උතුරු සහ නැගෙනහිර පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. විශාල හා මධ්‍යම පරිමාණයේ වාරි මාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කරගෙන යාමේදී උතුරු සහ නැගෙනහිර පළාත් වලට ආධාර කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,661 කට සමාන ජපන් යෙන් මිලියන 2,003 ක් වන අතර, එයින් ජපන් යෙන් මිලියන 1,633 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2003 මාර්තු 26 දින ආරම්භ කර තිබුණු අතර, 2010 මාර්තු වන විට නිම කිරීමට නියමිත විය. කෙසේ වුවද, ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම වර්ෂ දෙකකට වඩා ප්‍රමාද වූ අතර පසුව මෙම ව්‍යාපෘතිය 2005 මැයි 01 දින අත් හිටුවා , 2006 වර්ෂයේදී නැවත ආරම්භ කර තිබුණි. පසුව ව්‍යාපෘතිය නිම කිරීමේ කාල පරිච්ඡේදය 2013 මැයි 22 දක්වා දීර්ඝ කර තිබුණු අතර නිම කිරීමේ දිනයේ සිට මාස තුනක අනුග්‍රහ කාලයක් ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ලබාදී තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශවාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) ආරම්භක අත්තිකාරම, අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 මැයි 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතන්වලට අනුකූල වූයේද යන බව.

3. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 මැය 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 මැයි 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව ,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

---------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

-----------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.43,094,741 ක් වූ අතර, 2013 මැයි 31 දිනට සමුච්චිත වියදම රු.2,548,256,695 ක් විය. සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා වියදම, පෙර වර්ෂය සඳහා වියදම සහ 2013 මැයි 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **වියදම් වර්ගය** | **2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා වියදම** | **2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | **2013 මැයි 31 දිනට සමුච්චිත වියදම** |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 18,178,608 | 219,539,496 | 1,704,277,681 |
| වාහන හා උපකරණ | 9,500 | 102,513 | 139,748,860 |
| උපදේශක සේවා | නැත | 80,319,037 | 361,467,646 |
| සමාජ සචලීකරණය | නැත | නැත | 9,470,530 |
| පුහුණු | නැත | නැත | 4,306,573 |
| ජීවනෝපාය සහාය | නැත | 926,121 | 43,810,184 |
| අත්තිකාරම් නිරවුල් කිරීම | නැත | (15,258,351) | නැත |
| ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය | 5,390,703 | 25,563,801 | 149,234,799 |
| පොලී හා සේවා ගාස්තු | 19,515,930 | 47,025,500 | 135,940,422 |
| | 43,094,741 | 358,218,117 | 2,548,256,695 |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු ගිණුම් වාර්තාවලට අනුව ව්‍යාපෘති කටයුතු සඳහා පවත්වන ලද අග්‍රිම අරමුදල් ගිණුමේ සමාලෝචිත මාස පහක කාල පරිච්ඡේදය තුළ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | ජපන් යෙන් | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 9,046,113 | 13,387,343 |
| එකතු කළා :- ඌන පූරණයන් | 3,393,264 | 4,761,198 |
| විදේශ විනිමය වාසිය/ (පාඩුව) | - | (825,037) |
| | 12,439,377 | 17,323,504 |
| අඩුකළා:- ආපසු ගැනීම් | (12,439,377) | (17,323,504) |
| 2013 මැයි 31 දිනට ශේෂය | නැත | නැත |

## 5. විගණන නිරීක්ෂණය

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල විනිමය අනුපාත වෙනස ලෙස රු.20,054 ක මුදලක් දක්වා තිබුණි. කෙසේ වුවද විනිමය අනුපාත වෙනස පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය තුළ මුළු ප්‍රතිපාදනය, තථ්‍ය වියදම සහ අරමුදල් උපයෝජනයේ ප්‍රතිශතය පහත දැක්වේ.

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| ඒකාබද්ධ අරමුදල | 20,000,000 | 9,868,043 | 49.34 |
| ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර - ණය | 75,000,000 | 36,839,436 | 49.12 |
| | 95,000,000 | 46,707,479* | 49.16 |

* පෙර වර්ෂය සඳහා ගෙවන ලද එකතුව රු.3,612,738 ක් වූ රඳවා ගැනීම් මුදල් ඇතුළත් කිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දක්වා ඇති මුදලින් මෙම මුදල වෙනස් වේ.

**6.1 කාර්ය සාධන සමාලෝචනය**

2013 මැයි 31 දිනට ව්‍යාපෘතියේ පුනරුත්ථාපන වැඩ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය පිළිබඳ මූල්‍ය ප්‍රගතිය**

| ජලාශයේ නම | දිස්ත්‍රික්කය | මුළු ප්‍රතිපාදනය | කොන්ත්‍රාත් මුදල | 2013 මැයි 31 දක්වා තථ්‍ය වියදම | වියදම කොන්ත්‍රාත් මුදලෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | % |
| <u>උතුරු පළාත</u> | | | | | |
| මා මඩුව | වවුනියා | 50.00 | 49.02 | 48.88 | 99.71 |
| නම්පන්කුලම් | වවුනියා | 29.00 | 28.98 | 28.55 | 98.52 |
| තඩ්වනමරුතමඩු | මන්නාරම | 51.00 | 50.90 | 50.89 | 99.98 |
| අක්කරායන් කුලම් | කිලිනොච්චි | 400.00 | 401.00 | 399.10 | 99.52 |
| තෙනියන් | මුලතිව් | 93.50 | 94.00 | 93.56 | 99.53 |
| අකතිමුර්ප්පුකුලම් | මන්නාරම | 162.00 | 320.35 | 161.90 | 50.54* |
| <u>නැගෙනහිර පළාත</u> | | | | | |
| බොරපොල | අම්පාර | 42.00 | 41.63 | 41.30 | 99.21 |
| මොරවැව | ත්‍රිකුණාමලය | 267.80 | 267.56 | 267.49 | 99.97 |
| කුරන්ගුපන්චන් | ත්‍රිකුණාමලය | 50.00 | 49.61 | 49.58 | 99.94 |
| පුළුගනාවි | මඩකලපුව | 394.92 | 395.76 | 396.28 | 100.13 |
| එකතුව | | <u>1,540.22</u> | <u>1,698.81</u> | <u>1,537.53</u> | 90.51 |

* අකතිමුර්ප්පුකුලම් යෝජනා ක්‍රමයේ අනුරාධපුර හා කුරුණෑගල සංරචකය 2011 මාර්තු මාසයේදී මධ්‍යම වාරි මාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි.

**(ආ) 2013 මැයි 31 දිනට වාරි මාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය පිළිබඳ භෞතික ප්‍රගතිය**

| ජලාශයේ නම | වාරිමාර්ග සැලසු ප්‍රදේශය (හෙක්ටයාර්) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව | කොන්ත්‍රාත් පැකේජ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | ඉලක්කය සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | කොටසක් නිමකළ හා නවතා දැමූ |

| | | | | | |
|---|---|---|---|---|---|
| **උතුරු පළාත** | | | | | |
| --------------- | | | | | |
| මා මඩුව | 267 | 285 | 10 | 6 | 4 |
| නම්පන්කුලම් | 104 | 49 | 10 | 8 | 2 |
| තඩ්වනමරුතමඩු | 215 | 175 | 8 | 8 | - |
| අක්කරායන්කුලම් | 1,358 | 1,139 | 84 | 68 | 16 |
| තෙනියන් | 344 | 340 | 18 | 18 | - |
| **නැගෙනහිර පළාත** | | | | | |
| ---------------------- | | | | | |
| බොරපොළ | 200 | 625 | 10 | 8 | 2 |
| මොරවැව | 1,636 | 1,600 | 64 | 50 | 14 |
| කුරන්ගුපන්චන් | 202 | 254 | 13 | 9 | 4 |
| පුළුගනවි | 1,755 | 750 | 63 | 50 | 13 |
| | ----- | ----- | ----- | ----- | ----- |
| එකතුව | 6,081 | 5,217 | 280 | 225 | 55 |

ව්‍යාපෘතිය ආරම්භයේ සිට වර්ෂ 7 1/2 කට පසු, වාරි මාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය සඳහා මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,538 ක මුදලක් හෙවත් සියයට 90.51 ක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත් පැකේජ 280 ක් වූ ඉලක්කයෙන් 2013 මැයි 31 දිනට පැකේජ 225 ක් හෙවත් සියයට 80.35 ක් පමණක් සම්පූර්ණයෙන් නිමකර තිබුණි.